# කුමාරතුංග හා වික්‍රමසිංහ

ලංකාව කුඩා රටක් බව පුන පුනා කියමින් ඒ බව බටහිරයන්නේ මරකේටර ප්‍රක්ෂේපණ සිතියම ඇසුරෙන් ද තහවුරු කරමින් අප උගතුන් කුරුම්ට්ටන් කිරීම තවදුරටත් කරගෙන ගියේ බටහිරයන්ගේ ප්‍රවාද ඇසුරෙන් ය. මේ ප්‍රවාද ලංකාවට පමණක් නොව සියළු යටත්විජිතවලට වලංගු විය. බටහිර විද්‍යාව හා අනෙක් බටහිර දැනුම් ඊනියා වාස්තවික තත්වයකට පත්කිරීමට උත්සාහ කිරීම ඉන් එකකි. මේ බටහිර ප්‍රවාද ගැන කතාකිරීමට පෙර අප උගතුන්ගෙන් පිරිසක් බටහිරට හා ඉන්දියාවට ප්‍රතිචාර දැක්වූ වැදගත් ආකාරයක් ගැන කෙටියෙන් හෝ සඳහන් කරමු.

අපේ විද්‍යාවක්, සංගීතයක්, වෙදකමක් ආදී වශයෙන් ශිල්ප හා ශාස්ත්‍ර නොමැති යැයි කීමේ ප්‍රතිඵලයක් ලෙස මෙරට උගත් තරුණයන් ඉගෙනීම සඳහා බටහිර රටවලට, විශේෂයෙන් ම එංගලන්තයට, හා ඉන්දියාවට ගිය බව අපි දුටුවෙමු. සිංහල භාෂාවට වඩා ඉංගිරිසි භාෂාවට සහ සංස්කෘත හා පාළි භාෂාවලට ගරු කිරීමට අපට පුරුදු කරන ලදී. අපේ පැරණි ශිල්පයක් හෝ ශාස්ත්‍රයක් හෝ තිබිණි නම් ඒ පැරණි භාරතයෙන් ලැබුණු එකක් ලෙස සැලකීමට අපි පුරුදුවීමු. පැරණි සිංහල සාහිත්‍යය යනු පාළි හා සංස්කෘත සාහිත්‍යයන්හි පරිවර්තන ලෙස සැලකීමට අපට සිදුවිණි.

සිංහලයන් දඹදිවින් පැමිණි පිරිසක් බවත් විජය කුමරු හා හත්සියයෙන් පැවත එන්නන් බවත් අපට කියා දෙන ලදී. එයට වංශකතා සාහිත්‍යයෙන් හා ජනප්‍රවාදවලින් අනුබලයක් ලැබිණි. සිංහල භාෂාවේ මාතෘ භාෂා ලෙස සංස්කෘත හා පාළි සලකන ලදී. බුදුදහම හා බෞද්ධ සංස්කෘතිය අපට දඹදිවින් ම ලැබුණු දෑ ලෙස ඉගැන්විණි. වැව්යි දාගැබයි ලෝකයේ වෙනත් රටක ඒ ආකාරයෙන් දැකගත නොහැකි වූ බැවින් අපි ඒ ඉතිරිකර ගතිමු. අපේ මනස් දීන කෙරුණ ද වැව්යි දාගැබයි යන සංකල්පය පිටුපස වූයේ භාරතීය සංස්කෘතියෙන් බැහැර වූ අපේ ම වූ සංස්කෘතියක් අපට ඇත යන්න අප දැන සිටි බවත් ඒ බව අප වැව හා දාගැබ ඔස්සේ ලෝකයාට ප්‍රකාශ කළ බවත් ය.

මේ අතර අප භාරතයෙන් මුළුමනින් ම මෙන් ස්වාධීන බව පෙන්වීමේ ප්‍රවණතාවක් ද මෙරට විය. එය ඉතා තීව්‍ර ව ප්‍රකාශ වූයේ හෙළ හවුළ මගින් ය. කුමාරතුංග මුනිදාස මහතා මේ ප්‍රවණතාවෙහි ප්‍රධාන ප්‍රකාශකයා මෙන් ම ප්‍රවාද නිර්මාණකරු ද විය. සිංහල ජාතියේ ආරම්භය ගැන මෙන් ම සිංහල භාෂාව ගැන ද එතුමාට වෙන ම මතිමතාන්තර විය. සිංහල ජාතියේ ආරම්භය විජය කුමරු හා පිරිසට පැවරීමට එතුමාගේ කිසිම කැමැත්තක් නො වි ය. මෙරට විසූ යක්ෂ, නාග, දේව හා රාක්ෂස ගෝත්‍රවල එක්වීමෙන් පණ්ඩුකාභය රජු දවස සිංහයන් ලානය කිරීමෙන් සිංහල ජාතිය නිර්මාණය වීය යන්න කුමාරතුංග මුනිදාස මහතා ප්‍රමුඛ හෙළ හවුළේ මතය විය. පණ්ඩුකාභය කුමරු සිංහ ගෝත්‍රයට සම්බන්ධ නැතැයි කීම සඳහා කුමාරතුංග මහතා කුමරුගේ පීතෘත්වය චිත්‍රරාජ නම් යක්ෂ නායකයාට පැවරීමට පවා උත්සාහ කෙළේ වැදගත් සාක්ෂියක් නොමැති ව ය.

හෙළ හවුළ අවසාන වශයෙන් කෙළේ තමන්ට අවශ්‍ය නිගමනවලට එළඹීමට ඉතිහාසය සකස්කිරීම ය. සංස්කෘතික ව හා ඓතිහාසිකව භාරතයෙන් නිදහස්වීම කුමාරතුංග මහතාගේ අභිප්‍රාය විය. එහෙත් ඒ සඳහා සාධක නොමැතිව ඉතිහාසයක් ගෙතීමට වෑයම්කිරීම අනුමත කළ හැකි නො වෙයි. මෙරට විජය කුමරු පැමිණීමට පෙර සංස්කෘතියක් තිබුණු බව සැබෑ ය. එමෙන් ම පසුකාලීනව භාරතයෙන් ඇතැම් සංස්කෘතිකාංග ලැබීමට පෙර ද මෙරට දියුණු සංස්කෘතියක් තිබුණු බව ද පිළිගත යුතු වෙයි. එහෙත් ප්‍රශ්නය වනුයේ ඒ දියුණු සංස්කෘතියෙහි ද අපට භාරතයෙන් ලැබුණු දෑ අමතක කිරීමට නො හැකිවීම ය. එමෙන් ම බුදුදහම ලැබීමට පෙර ද විජය කුමරු පැමිණීමට පෙර ද මෙරට හා භාරතය අතර සම්බන්ධකම් තිබූ බව ද අමතක නොකළ හැකි ය. ඒ හේතුවෙන් මෙරටින් ඇතැම් සංස්කෘතිකාංග භාරතයට ලැබුණු බව ද නිසැක ය.

කුමාරතුංග මහතාට පැරණි හෙළ ඉතිහාසයක් ගෙතීමට ආධාර වී ඇත්තේ පොන්නම්බලම් අරුණාශලම් මහතා ලංකා ඉතිහාසය ගැන පළකර ඇති අදහස් යැයි මා අසා ඇත. අරුණාශලම් මහතා විෂ්ණු පුරාණයෙහි හා වෙනත් හින්දු පොත පතෙහි සඳහන් කරුණු ලංකා ඉතිහාසයට ගැලපීමට උත්සාහයක් ගෙන ඇත. ඒ මහතා එසේ කරන්නට ඇත්තේ දෙමළ ඉතිහාසයක් ගොඩනැගීම පැත්තෙන් විය යුතු ය. එහෙත් ඒ බවක් එතුමා කෙළින් ම කියා නැති බව ද

© Prof. Nalin De Silva

පිළිගත යුතු ය. කෙසේ වුවත් කුමාරතුංග මහතා ඒ අදහස් මත පිහිටීමෙන් බලි, තාරක, රාවණ ආදී රජ පරපුරක් කරා දිව යන හෙළ ඉතිහාසයක් ගැන කතා කෙළේ ය.

එපමණක් නොව සිංහල භාෂාවේ මාතෘ භාෂා සංස්කෘත හා පාළි වේ ය යන මතයට ද එතුමා විරුද්ධ විය. එතුමාට අනුව පාළි යනු මහාවිහාරික භික්ෂූන් වහන්සේ විසින් නිර්මාණය කරන ලද භාෂාවක් විය. ඉන් ගම්‍යවන්නේ සිංහල භාෂාවෙහි බලපෑම පාළි භාෂාවෙහි දැකිය හැකි ය යන්න ය. එහෙත් මේ මතය කෙතරම් දුරට තහවුරු කළ හැකි ද යන්න ප්‍රශ්නයක් වෙයි. පාළි භාෂාවෙහි ව්‍යාකරණය සිංහල භාෂාවේ ව්‍යාකරණය දෙස බලා සකස් කරන ලද්දක් නොව, (ලේඛන) සිංහල භාෂාවට හිමිකර දී ඇති ව්‍යාකරණය පාළි (හා සංස්කෘත) ව්‍යාකරණ දෙස බලා සකස් කරන ලද්දක් බවට සාක්ෂි වෙයි. කුමාරතුංග මහතා ම පෙන්වා දී ඇත්තේ සිංහල භාෂාවෙහි විභක්ති වුව ද අපට පාසල්වල පාළි භාෂාව ආශ්‍රයෙන් උගන්වන සිංහල විභක්තිවලට වඩා වෙනස් බව ය. ලේඛන සිංහලයට විභක්ති නවයක් අමාරුවෙන් එකතුකර ඇත්තේ පාළි භාෂාව අනුකරණයෙන් බව පැහැදිලි ය.

මහාවිහාරය දඹදිව සංස්කෘතික මධ්‍යස්ථානයක් බවටත් දඹදිවට අප යටත්කළ ආයතනයක් බවටත් ඇතැමුන් අතර මතයක් පැතිරවූයේ ඉහත සඳහන් කරුණු ද උපයෝගී කරගනිමින් ය. ඒ මතය පැතිරවූවෝ අභයගිරිය දේශීය මධ්‍යස්ථානය ලෙස සැලකූහ. අද පවා මහාවිහාරයට එරෙහි ව යන රාජ්‍ය නොවන උගත්තු ද අභයගිරිය දේශීය කලා ශිල්පවල තෝතැන්න ලෙස සලකති. එහෙත් කුමාරතුංග මුනිදාස මහතා මෙන් ම මේ උගත්තු ද නොදන්නා ඉතිහාසයක් ඇත. ඒ ඉතිහාසය අපි කලින් සාකච්ඡා කර ඇත්තෙමු. මහාවිහාරය දඹදිව සංස්කෘතික මධ්‍යස්ථානයක් වූවා නොව අවසානයේ දී මෙරට පමණක් නොව මුළු ලෝකයේ ම ථෙරවාදයේ ආරක්ෂකයා විය. පස්වැනි සියවසෙන් පමණ පසුව සිංහලයන්ගේ ඉතිහාසය ගොඩනැගී ඇත්තේ ථෙරවාදය රැකීම  පදනම් කරගෙන බව පැහැදිලි ය.

අභයගිරිය එකල භාරතයේ තිබූ සියළු දැනුම්වලට දොර විවෘත කෙළේ ය. එය කිසිසේත් ම දේශීය දැනුමෙහි ආරක්ෂකයා නො වී ය. මහායානය, තන්ත්‍රයානය ආදිය පමණක් නොව වෛදික මතිමතාන්තර ද අභයගිරිය ඔස්සේ ලංකාවට හානිකර අන්දමින් පැමිණිනි. ඒ අද විශ්වවිද්‍යාල, ජනමාධ්‍ය, පාසල්, රාජ්‍ය නොවන ආයතන ආදිය ඔස්සේ බටහිර මතිමතාන්තර ලංකාවට ගලාගෙන එන අයුරින් ය. බුද්ධදහමට, එනම් ථෙරවාද බුද්ධදහමට විරුද්ධ වූ ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් අභයගිරියට පක්ෂපාති වී ඇති බව පැහැදිලි ය. අර්ධ යක්ෂ සම්භවයක් තිබිණි යැයි සැලකිය හැකි මහසෙන් රජු ද සොළී භික්ෂුවක විසින් මෙහෙයවන ලදුව මහාවිහාරයට විරුද්ධ විය.

අභයගිරිය ථෙරවාදයට පමණක් නොව බුද්ධදහමේ වෙනත් ගුරුකුලවලට හා වෛදික මතිමතාන්තරවලට දොර විවෘතකිරීම නිසා ඒ දේශීය මධ්‍යස්ථානයක් බවට පත් නො වෙයි. එසේ නම් අද පවතින රාජ්‍ය නොවන ආයතන ද දේශීය මධ්‍යස්ථාන විය යුතු ය. මෙහි දී අවධාරණය කළ යුතු වැදගත් කරුණක් වෙයි. අභයගිරිය වුව ද ථෙරවාදයට විරුද්ධ නො වී ය. අභයගිරිය විසින් කෙරුණේ මහාවිහාරය විසින් තේරුම්ගන්නා ලද තර්ජනය තේරුම් නොගෙන ථෙරවාදයට විරුද්ධ මතවාදවලට ද දොර විවෘත කිරීම ය. මහාවිහාරයේ තහංචි නොවන්නට අභයගිරියේ ක්‍රියාකලාපය හේතුකොටගෙන අප පළමුව මහායාන බවටත් ඉන්පසුව වෛදික හා අවසානයේ දී හින්දු බවටත් පත්වනු නො අනුමාන ය.

මහාවිහාරයෙහි කාර්යභාරය තේරුම් නොගත්තේ කුමාරතුංග මුනිදාස මහතා පමණක් නො වේ. මාර්ටින් වික්‍රමසිංහ මහතාට ද ඒ පිළිබඳ අවබෝධයක් නො වී ය. සිංහලයෙන් තිබූ බෞද්ධ පොතපත බුද්ධඝෝෂ හිමියන් අතින් පාළියට පෙරළීම වික්‍රමසිංහ මහතා දුටුවේ ඔත්තුකාරයකු විසින් කරන ලද කුමන්ත්‍රණයක් ලෙස ය. කුමාරතුංග මහතා පැහැදිලි ව ම එමගින් සිංහල භාෂාවට බලවත් හානියක් වූ බව සඳහන් කෙළේ ය. එහෙත් මේ දෙදෙනා හා වෙනත් අය තේරුම් නොගත් කරුණ වූයේ මහාවිහාරය විසින් සිංහල භාෂාවේ පමණක් නොව අපේ දැනුමේ වර්ධනයට ද තහංචියක් පනවන ලද නමුත් ඒ හේතුවෙන් සිංහල ජාතිය රැකුණු බව ය. එසේ නොකරන්නට අප අවසානයේ දී හින්දුවීමට තිබුණා පමණක් නොව දෙමළ හෝ වෙනත් ද්‍රවිඩ භාෂාවක් හෝ කතාකරන ජාතියක් බවට ද පත්වීමට තිබුණි. එසේ වූවා නම් කුමාරතුංග මහතාට මෙන් ම වික්‍රමසිංහ මහතාට ද ලිවීමට සිදුවීමට තිබුණේ ද්‍රවිඩ භාෂාවකිනි. ඒ මහතුන්ට ලිවීමට හා කතාකිරීමට සිංහල භාෂාව ඉතිරි වී තිබුණේ ද මහාවිහාරය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය හේතුකොටගෙන ය. අද දෙමළ ජාතිවාදීන්ගේ වෛරයට මහාවිහාරය හා එහි ලියැවුණු වංසකතා පාත්‍ර වී ඇත්තේ ද

© Prof. Nalin De Silva

මහාවිහාරය දුරදර්ශීව ක්‍රියාකරමින් සිංහල භාෂාව, සිංහල ජාතිය හා ථෙරවාදය රැකගැනීමට අතීතයේ දී කටයුතු කර ඇති බැවින් හා මහාවිහාර සම්ප්‍රදායට අයත්වන භික්ෂූන් වහන්සේ අතින් අද ද ඒ කාරයය කෙරෙන බැවින් ය.

කුමාරතුංග මහතාත් ඔහුටත් වඩා වික්‍රමසිංහ මහතාත් බටහිර නූතනත්වයේ දරුවෝ වූහ. කුමාරතුංග මහතා භාරතයට විරුද්ධ වූයේ සිංහලයේ අදීනත්වය වෙනුවෙන් බව මූලික ව පෙනී යන කරුණකි. සිංහලත්වයේ අදීනත්වය වෙනුවෙන් කටයුතුකිරීම ඉතා වැදගත් ය. එහෙත් අප එමගින් අපේ අනෙක් සම්බන්ධකම් නැතිකරගන්නේ නම් අපට එහි දී ප්‍රශ්න මතුවෙයි. අපේ කලාපීය සම්බන්ධකම් නැතිකරගත් විට අපට ඉතිරිවන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පමණකි. සිංහල භාෂාවට වින කළ බව පවසමින් භික්ෂූන් වහන්සේ විවේචනය කිරීමේ ප්‍රතිඵලය වනුයේ කුමක් ද යන්න පැහැදිලි ය. හෙළ හවුළට ඇතැම් කතෝලික බැතිමතුන් ඇදී ආයේ එහි මූලික බෞද්ධ විරෝධයක් වූ බැවිනි. සිංහල භාෂාව ගැන කතාකළ ද ඒ වෙනුවෙන් වැඩකළ ද හෙළ හවුළට භික්ෂූන් වහන්සේලා එතරම් ආකර්ෂණය නොවීම ද මෙහි දී වැදගත් වෙයි. එමෙන් ම අනෙක් විෂය සම්බන්ධයෙන් ගත්කල කුමාරතුංග මහතා බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස්වලට විරුද්ධව නො ගියේ ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ද සිංහල සංස්කෘතියේ අදීනත්වය වෙනුවෙන් පෙනී සිටියේ ය. ඒ මහතා සිංහල සංස්කෘතිය භරතීය සංස්කෘතියෙන් අදීන ව වෙනස්වන ආකාරය පැහැදිලි කෙළේ ය. සිංහල බෞද්ධ සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් අදීන බව සැබෑ ය. එහෙත් එයින් කියැවෙන්නේ අපේ කලාපීය සම්බන්ධකම් වලින් අප නිදහස් වන බව නො වෙයි. අපේ සංස්කෘතිය මේ කලාපයේ තවත් සංස්කෘතියකි. එයට කලාපයේ අනෙක් සංස්කෘතීන් බලපා ඇත. එමෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතිය කලාපයේ අනෙක් සංස්කෘතීන්ට ද, කලාපයෙන් පිට අග්නිදිග ආසියාවේ වියට්නාමය දක්වා සංස්කෘතීන්ට ද බලපා ඇත. වික්‍රමසිංහ මහතාගේ ව්‍යාපෘතියේ අරමුණක් වූයේ අපේ සංස්කෘතිය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමග පෑහෙන බව පෙන්වීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva